10 ශ්‍රේණිය

බුද්ධ ධර්මය

10 පාඩම

සැකසුම හා ඉදිරිපත් කිරීම

ඒ. වී. චමින්ද විජේකුමාර ආරියදාස මයා
කෑ/ දෙහි/ සීපෝත් සේනානායක ක. වි.

අධීක්ෂණය

බී.ඒ.අයි.අයි.සංජු ලෝචන මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල හා ආගම)
දෙහිඕවිට අධ්‍යාපන කලාපය

chamindavijeekumara@gmail.com
දු.ක. අංකය :- 0718416477, 0702035765

10 පාඩම

රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

පද්මාකාර ජීවිතය

සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ

වේරිනේසු මනුස්සේසු - විහරාම අවේරිනෝ

ධම්ම පදය - සුඛ වග්ගය

(අපි වෛර කරන්නවුන් අතර අවෛරී ව සුවසේ වාසය කරමු)

රුදුරු මිනිසුන් අතර වෙමු අපි සොඳුරු මිනිසුන්

පද්මාකාර ජීවිතය යනු

මඩ වතුරෙන් ඉහළට මතු වී එහි නොගැවී සිටින නෙලුම් මල් මෙන් බුද්ධා දී උතුමෝ කෙලෙස් මඩ වතුරෙන් ඉහළට නැගී එහි නොගැවී වැඩ වසන අතර, එම ජීවිතය හැඳින්වෙන්නේ පද්මාකාර ජීවිතය යනුවෙනි

පද්ම උපමාව අනුව බුදුරදුන් වදාළ ත්‍රිවිධ පුද්ගලයන්

01 ඉතා නොදියුණු අවම පෞරුෂ ඇති අය
(මොවුන් මඩෙහි ම ගැලී සිටින නෙලුම් පොහොට්ටු වැනි ය)

02 මධ්‍යම වර්ධන සහිත පෞරුෂ ඇති අය
(මොවුන් මඩ ජලය හා සම ව සිටින නෙලුම් පොහොට්ටු වැනි ය)

03 උත්තම පෞරුෂ ඇති බුද්ධාදී උතුමෝ
(බුද්ධා දී උතුමෝ මඩ වතුරෙන් ඉවළට මතු වී එහි නොගැවී සිටින නෙලුම් මල් වැනි ය.)

ලෝකයේ ප්‍රධාන වශයෙන් පුද්ගල කොටස් දෙකක් සිටින බව

1. අනුසෝතගාමි

(ගඟක් පහලට ම ගලා යන්නා සේ, මිනිස්සු රාගයෙන් රාගයට ම, ද්වේශයෙන් ද්වේශයට ම, මෝහයෙන් මෝහයට ම, කාමයෙන් කාමයට ම, වෛරයෙන් වෛරයට ම යාම යි)

2. පටිසෝතගාමි

(ගඟක් උඩුගං බලා ගලා යන්නා සේ, මිනිස්සු රාගයෙන් විරාගයට, ද්වේශයෙන් අද්වේශයට, මෝහයෙන් අමෝහයට, වෛරයෙන් අවෛරයට යාම යි)

බෞද්ධයන් වන අප පද්මාකාර ජීවිතයක් ගත කිරීම සඳහා කටයුතු කළ යුතු ආකාරය

“වෛර කරන්නවුන් අතර වෛර නොකර අපි සුවසේ වසන්නෙමු. අවෛරී ව ජීවත් වන්නෙමු. රාගා දී කෙලෙස් නිසා රෝගී වූ මිනිසුන් අතර අපි කෙලෙස් ලෙඩ නොමැති ව සුවසේ වසන්නෙමු. නිරෝගී ව ජීවත් වන්නෙමු. පස්කම් සැප සෙවීමෙහි ම උනන්දු වන්නන් අතර අපි එබඳු උනන්දුවකින් තොර ව සුවසේ ජීවත් වන්නෙමු. උත්සුක මිනිසුන් අතර අනුත්සුක ව වාසය කරන්නෙමු”

(බුදුරජාණන් වහන්සේ)

බෞද්ධයන් වන අප පද්මාකාර ජීවිතයක් ගත කිරීම සඳහා කටයුතු කළ යුතු ආකාරය

- ✓ අපිරිසිදු මඩ ජලය ඉක්මවා ගිය නෙලුමක් මෙන්, අවිද්‍යාවෙන් අන්ධ වූ රාගා දී කෙලෙස්වලින් දූෂිත වූ ලෝකය තුළ ඒවා හා නොගැටී සිටීමෙන්
- ✓ අවිද්‍යා තෘෂ්ණාදයෙහි ම නො ඇලී ගැලී නොසිට ඉන් ඔබ්බට යාමෙන්
- ✓ සසර දුකෙහි ම නොගැලී ඉහළට මතුවීමට උත්සවත් වීමෙන්
- ✓ අවම හා මධ්‍යම පෞරුෂ ඇත්තවුන් නොවී උපරිම පෞරුෂය ඇති අයෙකු වීම තුළින්

පාසල් ශිෂ්‍යයන් වන අප පද්මාකාර ජීවිතයක් ගත කිරීම සඳහා කටයුතු කළ යුතු ආකාරය

- වැරදි වලට පෙළඹෙන සිත ඉන් වළකා යහපත් දේ සඳහා යොමුකර ගැනීම
- අවිධිමත් අපිරිසිදු සමාජ ප්‍රවාහයට හසු නොවී යහපත් ලෙස තම අරමුණු කරා යාම තුළින්
- වැරදි බහුල සමාජ පරිසරයක දී වුව ද වැරදි නොකර සිටීමෙන්
- තමාගේ යහපත් ගුණ ධර්ම කිසිම හෙතුවක් නිසා නැතිකර නොගැනීමෙන්

පුහුණුවට

සුසුඛං වත ජීවාම - වේරිනේසු අවේරිනෝ

වේරිනේසු මනුස්සේසු - විහරාම අවේරිනෝ

(ධම්ම පදය - සුඛ වග්ගය)

අපි වෛර කරන්නවුන් අතර අවෛරී ව සුවසේ වාසය කරමු

තෙරුවන් සරණයි..!